# පුරප්පාඩු
# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2025.05.28** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර III ශ්‍රේණිය
## MANAGEMENT ASSISTANT (GRADE III)

**සුදුසුකම් :-**

1.අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

(i) සිංහල භාෂාව/දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

2.අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය :-** රු. **49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වයස :-** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

**සටහන :-** ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

## වැඩ සහායක III ශ්‍රේණිය
## WORKS AIDE (GRADE III)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයක් (06) අවමය සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව උපරිම වාර දෙකක දී සමත් වී තිබීම.

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් :-** රු. **42,775-16×450 – 49,975 (මාසික) U-PL 1(III)**

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :-** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## සේවා පැවරුම් පදනම මත පරිපාලක (යාන්ත්‍රික / විදුලි / ජලනල)
## SUPERVISOR (MEP) – on Assignment Basis

**සුදුසුකම් :**

(i). ජාතික තාක්ෂණ සහතික හෝ සමාන සුදුසුකම් සමඟ වසර තුනක (03) සේවා පළපුරුද්ද (සේවා පළපුරුද්ද ජාතික තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමේ කාලය තුල දී ලබා තිබීම.)

හෝ

(ii). දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගය විෂයයන් 06ක් සමත් වීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිපාලකයෙකු වශයෙන් වසර 05ක පළපුරුද්දක් තිබීම.

**වැටුප :-** රු. 75,000/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :-** සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :-** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සේවා පැවරුම් කාලසීමාව :** පළමුව වසරක සේවා පැවරුම් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ සේවා පැවරුම් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

## කොන්ත්‍රාත් පදනම මත රියදුරු
## DRIVER (on Contract)

**සුදුසුකම් :**

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයක් (06) අවමය සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව උපරිම වාර දෙකක දී සමත් වී තිබීම.

සහ

(ii) බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබාගෙන තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීමේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබීම.

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් :-** රු. 52,715/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :-** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**කොන්ත්‍රාත් කාලසීමාව :** පළමුව මාස 05ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

## කොන්ත්‍රාත් පදනම මත පුස්තකාල තොරතුරු සහකාර
## LIBRARY INFORMATION ASSISTANT (on Contract)

**සුදුසුකම් :-**

(1). අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

(i). සිංහල භාෂාව/දෙමළ භාෂාව
(ii).ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
(iii). ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

(2).අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ශිෂ්‍යත්වයක් හෝ අර්ධ කාලීන / පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක පරිගණක යෙදුම් සඳහා පිළිගත හැකි පාඨමාලාවක් හදාරා තිබීම.

**වැටුප :-** රු. 53,525/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :-** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වයස :-** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**කොන්ත්‍රාත් කාලසීමාව :** පළමුව මාස 05ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

## කොන්ත්‍රාත් පදනම මත ආරක්ෂක නියාමක
## SECURITY GUARD (on Contract)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයන් හයක් (06) අවමය සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව උපරිම වාර දෙකක දී සමත් වී තිබීම.

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් :-** රු. 49,825/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :-** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**කොන්ත්‍රාත් කාලසීමාව :** පළමුව මාස 05ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

## කොන්ත්‍රාත් පදනම මත පුස්තකාල සේවක
## LIBRARY ATTENDANT (on Contract)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයන් හයක් (06) අවමය සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව උපරිම වාර දෙකක දී සමත් වී තිබීම.

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් :-** රු. 49,825/- (දීමනා සමඟ)

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :-** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**කොන්ත්‍රාත් කාලසීමාව :** පළමුව මාස 05ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්ය සාධනය මත මෙම තනතුරේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සිදු කෙරේ.

---

**සටහන :** අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මඟින් එකී ඉපයීම් වලින් 15%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට හා 8%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදලට (ස්ථිර පදනම මත බඳවා ගන්නා සේවකභවතුන්හට) බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මඟින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ. එමෙන්ම සේවා අවශ්‍යතාවය මත සිදුකරනු ලබන අතිකාල සඳහා යම් සීමාවකට යටත්ව අතිකාල දීමනාවක් ගෙවනු ලැබේ.

අයදුම්පත් මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) 2025.05.14 දින පෙ.ව. 08.30 සිට 2025.05.28 දින ප.ව. 4.30 දක්වා විවෘතව පවතිනු ඇත.

මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා **https://hrms.sjp.ac.lk/vacancies/nonacademic** වෙත පිවිසිය යුතුය.

Apply Now!

අයදුම් කරනු ලබන තනතුරට තේරීපත්වුවහොත් අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් ලිපියක් අයදුම්පත සමඟ උඩුගත (Upload) කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පලපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතික වල ඡායා පිටපත් අමුණා නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

**ලේඛකාධිකාරී,**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2025.05.09